

# ශ්‍රී සුමංගල බාලිකාවනි අපට පාසල වෙනුවෙන් බොහෝ දෑ කළ හැකිය

**පානදුර ශ්‍රී සුමංගල බාලිකා විද්‍යාලය 1923 දී ආරම්භ කරන ලදී. දැනට අවු. 90කට වැඩි කාලයක් නිහඬව සේවයේ යෙදෙමින් උගතුන් රැසක් ජාතියට බිහිකල මෙම විදුහල් මාතාව කළුතර දිස්ත්‍රික්කයේ දිදුලන ප්‍රධානතම බෞද්ධ පාසලකි. සිසුවියන් හාර දහසකට පමණ සෙවන දෙන සුමංගල බාලිකාවන් වසරකට සිසුවියන් 150 - 200 ක් පමණ සරසවි වරම් ලබති. විද්‍යා, කළා, වාණිජ යන සියළුම විෂයයන්ගෙන් සරසවි අධ්‍යාපන පහසුකම් සපයන ශ්‍රී සුමංගල බාලිකාවෙන් අ.පො.ස. සාමාන්‍ය පෙළ කඩඉම පසු කරන සිසුවියන් සංඛ්‍යාවද බෙහෙවින් ඉහළ අගයක් ගනී.**

**මෙම විදුහල් මාතාවගේ සෙවනේ අධ්‍යාපනය හදාරන ලද සිසුවියෝ විශාල සංඛ්‍යාවක් අද මෙල්බර්න් නගරයේ වෙසෙති. ඔවුන් තම නුවණැස පෑදූ පාසල් මාතාව වෙනුවෙන් තමනට හැකි පමණින් දායකත්වය සැපයීමේ අරමුණින් ශ්‍රී සුමංගල බාලිකාවේ ආදි සිසු සංගමය මෙල්බර්න් නුවර පිහිටුවාගෙන ඇත. එම සංගමය පිළිබඳ තොරතුරු අප වෙත ලබා දීම සඳහා සංගමයේ සම සභාපති වෛද්‍ය නිර්මලී ජයසිංහත් ලේකම් උපේක්ෂා සේනානායකත් අද සන්නස සමඟ එක්වෙති.**



වෛද්‍ය නිර්මලී ජයසිංහ



උපේක්ෂා සේනානායක

**ශ්‍රීනාත්**
ඔබ දෙපලගෙන් මම අහන්න කැමතියි ඔබ මෙම ආදිශිෂ්‍ය සංගමය පිහිටුවා ගැනීමට හේතු වූ කරුණු  පිළිබඳව.

**වෛද්‍ය නිර්මලී**
ඕනෑම අයකුට තම මාපියන් හැරුණු විට ඔවුන්ගේ හා එම සේවයේ ලා සලකණු ලබන්නේ තමන්ට සිප් සතර ලබා දුන් පාසලැයි. පොත පතට සීමා වූ අධ්‍යාපනය පමණක් නොව පරිපූර්ණී මිනිසෙකු ලෙසට ජීවත් වීමට අවශ්‍ය වන දැනුම හා පන්නරය ලබා දෙන්නේ මේ නිසා වැඩිහිටියන් බවට පත් වූ පසු තමනට සිප් සතර මෙන්ම නැණ නුවණ සැපයූ පාසැල් මාතාව වෙනුවෙන් හැකි උපරිමයෙන් දායකත්වයක් සැපයීම හැමදෙනාගේම යුතුකමකි. මෙන්න මේ පදනම මත පිහිටා මෙල්බර්න්හි වෙසෙන පානදුර ශ්‍රී සුමංගල බාලිකාවේ ආදි සිසුවියන් එක්ව මෙම ආදි සිසු සංගමය පිහිටුනු ලැබුවා.




**උපේක්ෂා**
මා එයට උණ පූර්ණයක් ලබාදීමට කැමතියි. මෙම සංගමය පිහිටුවා ගැනීමට හේතු වූ තවත් කරුණක් තමයි මෙල්බර්න් හි ජීවත් වන අප පාසැලේ ආදි සිසු සිසුවියන් හඳුනාගෙන ඒ අය අතර සම්බන්ධතා ගොඩ නංවා ගැනීමත් එම සියළු දෙනා ගේ එකමුතුවෙන් වඩාත් ශක්තිමත් ලෙස පාසලට උපකාර කිරීමට හැකි පදනමක් සකස් කර ගැනීමත්.

**ශ්‍රීනාත්**
ඔබ මේ සංගමය පිහිටුවා ගත්තේ කුමන වකවා-නුවේද ?

**උපේක්ෂා**
2012 වසරේ මමත් යුරේනි පෙරේරා මහත්මියත් එක්ව මාධ්‍යයන්හි පල කල දැන්වීම් මාර්ගයෙන් 2012 මැයි මාසයේදී 17 දෙනෙකුගේ කණ්ඩායමක් රැස් කර ගැනීමට හැකි වුනා. මෙම කණ්ඩායමම ස්වේච්ඡාවෙන් මාස 4ක පමණ කාලයක් එක්ව කටයුතු කොට 2012 සැප්තැම්බර් 20 වන දින මහ සභා රැස්වීමක් පැවැත්වීමට හැකිවුනා. එහිදී පළමු සභාපතිනිය ලෙස සන්ධ්‍යා සිරිවර්ධන මහත්මිය ලේකම් ලෙස මා පත් වුනා. මේ විදියට තමයි මෙල්බර්න්හි පානදුර ශ්‍රී සුමංගල බාලිකා ආදි සිසු සංගමය බිහි වුනේ.

**ශ්‍රීනාත්** :

## 2014 සුමංගල රාත්‍රිය

### 2014 ජුනි 7වන දින හංගේරියන් ශාලාවේ දී

ඔබ මේ වන විට ඔබේ පාසල වෙත ලබා දී ඇති දායකත්වය විස්තර කලොත්.

**වෛද්‍ය නිර්මලී**
අපේ පාසැලේ බටහිර තූර්‍යවාදක කණ්ඩායමට අවශ්‍ය සංගීත භාණ්ඩ කිහිපයක අඩුවක් තිබුණා. ඉන් ප්‍රධාන එකක් තමයි ට්‍රී ට්‍රෑබා එකට අවශ්‍ය වූ ඔමෆ් නලාව. එය මිල අධික භාණ්ඩයක්. අපට හැකි වුනා 2013 මැයි මාසයේ පැවත් වූ අප සංගමයේ සාමාජිකත්වයේ එකමුතුවකින් ඒ සඳහා අවශ්‍ය වූ මුදල් සම්පාදනය කරගන්න. අප සංගමය එම භාණ්ඩ 2013 මැයි මාසයේ දී ම අප පාසල වෙත පරිත්‍යාග කලා.

**ශ්‍රීනාත්**
ඔබ සංගමය මෙහි වෙසෙන ආදී සිසුවියන් වෙනුවෙන් සංවිධානය කරන කටයුතු ගැන සඳහන් කලොත්.

**උපේක්ෂා**
අප සංගමයේ සාමාජිකත්වය මගින් සෑම දුරුතු පොහොයටම සින්ස්බරෝ විහාරස්ථානයේ සිල් සමාදන් වන උවැසි උවැසියන් සඳහා දානය පිළියෙළ කොට පුජා කරනවා. එමෙන්ම සාමාජිකත්වයේ යම් අයෙකුට කිසියම් කරදරයකට හෝ උපද්‍රවයකට මුහුණ දීමට සිදු වුවහොත් අප සංගමය ඒ වෙනුවෙන් කල හැකි උපරිම දායකත්වය ලබා දෙනවා.

**ශ්‍රීනාත්**
ඔබ සංගමයේ අනාගත සැලසුම් ගැන සඳහන් කලොත්.

**වෛද්‍ය නිර්මලී**
අප පාසලේ ආදි ශිෂ්‍ය සංගමය සමග කරන ලද සාකච්ඡාවකින් පසුව අපට දැනගැනීමට ලැබුනා බොහෝ දරුවන් අ.පො.ස උසස් පෙළ සමත් වී සරසවි වරම් ලැබුවද ආර්ථික අපහසුතා හේතුවෙන් පාසල හැරයන බව. මේ නිසා අප සංගමය තීරණය කලා උසස් අධ්‍යාපනයට සුදුසුකම් ලබන දරුවන්ට ශිෂ්‍යත්වයක් ලබා දීම මගින් උසස් අධ්‍යාපනය සඳහා ඔවුන් දිරිමත් කර-වන්න. මේ ශිෂ්‍යත්ව වැඩ සටහන සඳහා මුදල් රුස්කිරීම තමයි මීලග සැලසුම වන්නේ.

අප 2014 සුමංගල රාත්‍රිය නමින් එකමුතුවක් පැවැත්වීමට කටයුතු සැලසුම් කරනවා. එය 2014 ජුනි 7වන දින හංගේරියන් ශාලාවේ දී පැවැත්වෙනවා. සංගීතය සපයන්නේ මෙලබර්න්හි ප්‍රසිද්ධ වාදක මණ්ඩලයක් වන් ්දකසා ශ්‍රී සංගීත කණ්ඩායමයි. එදින අප හා එක්ව සුහදතාවය වර්ධනය කර ගැනීමට  අප ඔබ සැමට ආරාධනා කරනවා. මෙම ව්‍යාපෘතිය අප ක්‍රියාත්මක කරගන්නේ ශිෂ්‍යත්ව වැඩ සටහනට අවශ්‍ය මුල්‍ය ආධාර සපයා ගැනීමේ ආරම්භක ව්‍යාපෘතිය ලෙසටයි.

**උපේක්ෂා**
අප සැම දෙනාම මෙහිදී ගත කරන්නේ කාර්ය බහුල ජිවිතයක්. ඒ නිසා සැම ශ්‍රී සුමංගල බාලිකාවේ ආදී සිසුන් සැමදෙනාටම සෑම රැස්වීමකටම සහභාගී වීමට හැකියාවක් නැති බව අප දන්නවා. එහෙත් අප සංගමය මගින් දියත් කෙරෙන විශේෂ ව්‍යාපෘති සඳහා ඔබ සහභාගි වනවා නම් එය සංගමයට විශාල ශක්තියක් බව සඳහන් කල යුතුයි.

**ශ්‍රීනාත්**
මෙල්බන් හි, විසිරී සිටින ඔබේ පාසලේ ආදී සිසුවියන්ට ඔබ සංගමයේ නිළධාරි මඩුල්ල පිළිබඳව දැනුවත් කිරීම ප්‍රයෝජනවත් වේවි යැයි සිතනවා.

**වෛද්‍ය නිර්මලී**
අප සංගමයේ නිළධාරි මඩුල්ල පමණක් නොව එහි සියළු සාමාජිකත්වය සංගමයේ කටයුතු සඳහා උපරිම අයුරින් දායකත්වය සපයනවා. සංගමයේ වත්මන් නිළධාරි මඩුල්ල වන්නේ,

| | |
|---|---|
| සම සභාපති | : වෛද්‍ය නිර්මලී ජයසිංහ<br>සන්ධ්‍යා සිරිවර්ධන |
| ලේකම් | : උපේක්ෂා සේනානායක |
| උප ලේකම් | : ප්‍රමිලා මධුෂානි |
| භාණ්ඩාගාරික | : වෛද්‍ය රන්ජනී අතුකෝරල |
| උප භාණ්ඩාගාරික | : ලක්මිණී වීරමන්ත්‍රී |

විස්තර සඳහා අමතන්න.

උපේක්ෂා රත්නායක
දුරකථන (03) 87593082
මොබයිල් 0450458829
email iamupekasha@gmail.com

**ශ්‍රීනාත්** :
ශ්‍රී සුමංගල බාලිකාවන් තම පාසැල් මාතාව වෙනුවෙන් තම උපරිම ශක්තියෙන් සේවය කරන්නට උරදී සිටින මේ මොහොතේ ඒ සඳහා ධෛර්යය හා ශක්තිය ලැබේවා යැයි සන්නස වෙනුවෙන් අප ප්‍රාර්ථනා කරනවා. එමෙන්ම වික්ටෝරියාවේ විසිරී සිටින ශ්‍රී සුමංගල බාලිකා ආදී සිසුවියන්ට මෙම සංගමය සමග අත්වැල් බැඳගන්නට අපි ආරාධනා කරනවා.